**ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කොරියානු ජනරජයේ රාජ්‍ය සංචාරයක නියැළේ.**

කොරියානු ජනාධිපති මුන් ජෙයින් මැතිතුමාගේ ඇරයුමෙන් ශ්‍රී ලංකා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා 2017නොවැම්බර් මස 28 වැනි දා සිට 30 වැනි දා දක්වා එරට රාජ්‍ය සංචාරයක නිරතවීමට නියමිතය. මෙම සංචාරය ශ්‍රී ලංකාව හා කොරියානු ජනරජය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතාවන් ස්ථාපනය කිරීමෙහි 40 වැනි සංවත්සරයට සමගාමී ව සිදුවන්නකි.

ජනාධිපති මුන් මහතා, ජනාධිපති සිරිසේන මහතා සමුළු සාකච්ඡාවක් සඳහා නොවැම්බර් මස 29 වැනිදා හමුවීමට නියමිත අතර අනතුරුව ශ්‍රී ලංකා ජනාධිපතිවරයා සඳහා රාජ්‍ය රාත්‍රී භෝජන සංග්‍රහයක් පැවැත්වීමට නියමිත ය. ශ්‍රී ලංකාව හා කොරියානු ජනරජය අතර සහයෝගීතාවය වඩාත් පුළුල් කර ගැනීම සඳහා දෙරටේ රාජ්‍ය නායකයින් අන්‍යෝන්‍ය වශයෙන් උනන්දුවක් දක්වන කාරණා සම්බන්ධයෙන් සාකච්ඡා කරනු ලබති.

මෙම සංචාරය අතරතුර, රජයන් දෙක අතර ආර්ථික සහයෝගීතාව, ආර්ථික සංවර්ධන සහයෝගීතා අරමුදල හා සංස්කෘතික සහයෝගීතාව හා සම්බන්ධ ගිවිසුම් කිහිපයකට මෙන් ම ආයෝජන සහායෝගීතාව හා රැකියා බලපත්‍ර ක්‍රමයට අදාළ අවබෝධතා ගිවිසුම් කිහිපයකට ද අත්සන් තැබීමට නියමිතය.

තවද, ප්‍රධාන පෙළේ කොරියානු ව්‍යාපාරික සංගම් හතරක සම සත්කාරකත්වය දරන ව්‍යාපාරික දිවා භෝජන සංග්‍රහයකට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහභාගිවීමට නියමිත අතර එරට වෙසෙන ශ්‍රී ලාංකීක ප්‍රජාව ද හමුවීමට අපේක්ෂිතය.

විදේශ කටයුතු අමාත්‍යාංශය
කොළඹ.

2017 නොවැම්බර් මස 22 වැනි දා